# විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව ශක්තිමත් කිරීම

ආර්.ඇම්. රත්නායක,
කලමනාකරණ හා ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලය, මාතර.

**සංක්ෂිප්තය**

මේ අධ්‍යයනයෙන් මූලික වශයෙන් අවධානය යොමු වූයේ රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය තුළ පවතින ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාවේ ස්වභාවය හඳුනාගැනීමයි. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පිළිබඳව පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් මෙම පීඨය තෝරා ගැනීමට බලපෑ හේතු කීපයක් වේ. පරිපාලන හා ව්‍යුහාත්මක වශයෙන් විවිධ වෙනස්කම් රාශියක් පසු ගිය කාලයේ මෙම පීඨය තුළ සිදු වී ඇත. අනෙකුත් පීඨ හා සසඳන විට ( මෑත කාලයේ ස්ථාපිත කරන ලද ජලජ හා මත්ස්‍ය විද්‍යා පීඨය හැර ) අඩුම ආචාර්යවරුන් සංඛ්‍යාවකින් විශාල සිසුන් සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබාදෙන පීඨය මෙය වීම ඒ අතර සුවිශේෂ වේ. මේ නිසා පීඨයේ ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව එහි අධ්‍යයන කටයුතු හා පරිපාලන කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගෙනයාමට වැදගත් වේ. මේ අනුව පීඨය තුළ අධ්‍යයන කටයුතුවල යෙදෙන ශිෂ්‍යයන්ගෙන් 140ක නියදියක් පර්යේෂණය සඳහා තෝරා ගනු ලැබීය. එමෙන් ම ආචාර්යවරු 20 දෙනෙක් ද තෝරා ගනු ලැබූහ. ශිෂ්‍යයන් තෝරා ගැනීමේ දී සියලුම ස්ථලවල සිසුන් නියෝජනය වන ආකාරයට තෝරා ගත් අතර ආචාර්යවරුන් තෝරා ගැනීමේ දී ජ්‍යෙෂ්ඨ හා ආධුනික වශයෙන් සලකා තෝරා ගනු ලැබීය. මෙම පීඨය තුළ ආධුනික ආචාර්යවරුන් අධික බැවින් නියදිය තුළ ඔවුන්ගේ වැඩි නියෝජනයක් දැක්වේ. තොරතුරු ලබා ගැනීමට ආචාර්යවරුන් සඳහා එක් ප්‍රශ්නාවලියක් ද, ශිෂ්‍යයන් සඳහා වෙනත් ප්‍රශ්නාවලියක් ද යොදා ගනු ලැබීය. මීට අමතරව තොරතුරු රැස්කිරීම සඳහා පීඨ පරිපාලනය හා ශිෂ්‍ය නායකයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබීය. දත්ත විශ්ලේෂණය කිරීමේ දී ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමය වැඩි වශයෙන් භාවිත කරනු ලැබීය. ආචාර්ය-ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම පොදු මතය වී තිබෙන්නේ මෑතකාලයෙහි දෙපාර්ශ්වය අතර පවත්නා සම්බන්ධතාව දුරස් වෙමින් පවතින බවයි. මෙයට බලපා තිබෙන හේතු විවිධ දෘෂ්ටිකෝණවලින් ඉදිරිපත් කර ඇත . විශේෂයෙන් ම විශ්වවිද්‍යාලය තුළ පවත්නා උපසංස්කෘතික සාධකයන් මෙයට මූලික වශයෙන් බලපා තිබෙන බව ශිෂ්‍යයන් වැඩි දෙනෙකුගේ මතය වී ඇත. ආචාර්යවරුන් මුණගැසීමට බාධාවක් නොමැති බව බොහෝ ශිෂ්‍යයන් ප්‍රකාශ කරනු ලැබූවත්, එවැනි සම්බන්ධතාවන් පවත්වා තිබෙන්නේ සුළුතර ශිෂ්‍ය පිරිසක් වේ. මේ සම්බන්ධව ආචාර්යවරුන් ශිෂ්‍යයන් කෙරෙහි දක්වන ආකල්ප මූලික වී ඇත. ආචාර්යවරුන්ගේ නායකත්ව කාර්යභාරය මනාව ඉටුනොවන තත්ත්වයක් තිබෙන බව බොහෝ සිසුන්ගේ අදහස වේ. ආචාර්යවරයා මඟ පෙන්වන්නකු ලෙස ශිෂ්‍යයන් තුළ තිබෙන පිළිගැනීම අභියෝගයට ලක්වී ඇත. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව වර්ධනය කර ගැනීම සඳහා ආචාර්යවරුන්ගේ කාර්යභාරය පිළිබඳව නැවත සලකා බැලීමට සිදුවේ. විශ්වවිද්‍යාලය තුළ පවත්නා පාඨමාලාවන්ගේ වැදගත්කම, ඇගයීම් රටාවන් සහ නව පාඨමාලාවන් හඳුන්වාදීමට කටයුතු කළ යුතුව ඇත.

සූචිය_: නායකත්වය , සංස්කෘතිය , පවත්නා ක්‍රමය

## හැඳින්වීම

ඉගැන්වීමට හා ඉගෙනීමට මඟ පෙන්වීමේ දී ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව අධ්‍යයන ක්ෂේත්‍රයේදී අතිශය වැදගත් සාධකයක් වේ. Sroufe's (1983, 1989) පර්යේෂණ වල සොයාගැනීමට අනුව මාපිය දූ දරු සම්බන්ධතාව ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව අධ්‍යයනය කිරීමට අවශ්‍ය සංකල්පීය (Conceptual) සහ ක්‍රමානුකූල වූ (Methodological) mokula සපයා දෙනු ලබයි. එමෙන් ම මෙම සම්බන්ධතාව සමාජීය වශයෙන් වැදගත් වන සම්බන්ධතා නිර්මාණය කර ගැනීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. එය ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවන් ගොඩනඟා ගැනීමේ දී පදනම් කර ගැනෙයි. (Pianta et al, 1995) පුළුල් ලෙස පිළිගත් අදහසක් වන්නේ පාසල් අධ්‍යා පනයෙන් පසු උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යයන් උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුළත්වීමේ දී විවිධ අභියෝගයන්ට හා අපහසුතාවන් ට මුහුණ පාන බවයි. එහි දී ඔවුන් විසින් ම සම කණ්ඩායම් ඇතිකර ගැනීම, ඔවුන් අතර අන්තර් සම්බන්ධතා ගොඩනඟාගැනීම සිදුවන අතර එය ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවල ක්‍රියාකාරීත්වයට බලපෑමක් ඇතිකරයි. (Gregoriadis, A; Tsigilis, N; 2008). පසුගිය කාලය තුළ ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවන් පිළිබඳ විවිධ ක්‍රම හා ක්‍රමෝපායයන් පදනම් කරගෙන විවිධ පර්යේෂණයන් සිදුකර ඇත. ඒවාට අනුව ශිෂ්‍යයන් පිළිබඳ ගුරුවරුන්ගේ අපේක්ෂාවන්, ඔවුන්ගේ හැසිරීම් රටාවන් පිළිබඳ පවත්නා වරණයන් නැතහොත් තේරීම් (Preference), ගුරුවරුන් අතර පවත්නා සම්බන්ධතාවය ශිෂ්‍යයින්ගේ ක්‍රියාකාරීත්වයේ දී වැදගත් වේ. (Pianta s, Nimetz; 1989). එමෙන්ම ශිෂ්‍යයින්ගේ නිපුණතා සම්බන්ධ කාර්යයන් වල හා දැනුම සම්බන්ධ කාර්යයන් වලට එමගින් බලපෑම් ඇතිවේ. ශිෂ්‍යයින්

ඔවුන්ගේ විශ්ව විද්‍යාල කාලය තුළදී විවිධ සමාජීය හා අධ්‍යාපනික වශයෙන් වැදගත් වන කාර්යයන් රාශියකට ගුරුවරුන් සමඟ කටයුතු කරනු දැකිය හැකිය. (Howes,e; Hamilton,1993) ආචාර්යවරුන්ගේ මූලික වගකීම (Fundamental Responsibility) වන්නේ ශිෂ්‍යයින්ට ඉගැන්වීම බව ඔවුන් අවබෝධ කරගෙන තිබේ. ආචාර්යවරුන්ගේ එම මූලික වගකීම නියම ආකාරයෙන් ඉටු නොවන වීට දී ශිෂ්‍යයින් ආචාර්යවරුන්ට දක්වන ගෞරවය අඩුවීමක් සිදුවේ. සමහර අවස්ථාවල දී ශිෂ්‍යයන් තුළ ඉගෙනීමට නිරතුරුව පවත්නා උනන්දුවක් නොමැති විට ආචාර්යවරුන් ශිෂ්‍යයන් ගැන තිබෙන සැළකිල්ල අඩු වේ. මෙය ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව දුරස් වීමට හේතු වේ. Woguera (1995) පිළිගන්නා ආකාරයට බොහෝ ආචාර්යවරුන් තම ශිෂ්‍යයින් පිළිබඳව විශේෂ කැමැත්තක්(Express a sincere desire) දක්වන අතර එය ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් කටයුතු වැඩිදියුණු වීමට උපකාර වනු ඇත. මේ අනුව ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව දියුණු වීමට ආචාර්යවරු ශිෂ්‍යයන් පිළිබඳ දක්වන සැළකිලිමත්භාවය (Caring) හා ඔවුන් පිළිබඳ තිබෙන අවබෝධය (Perception) වැදගත් සාධකයන් වේ. Coleman's ගේ සමාජ ප්‍රාග්ධනය පිළිබඳ න්‍යායට (Coleman's Theory of social capital) අනුව ආචාර්යවරු ශිෂ්‍යයන්ට උගන්වමින් ඔවුන් සමාජයට සම්බන්ධ කිරීමට සූදානම් කරති. මේ අනුව ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් යන දෙපාර්ශවයම ඉගෙනුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කරලීමට කටයුතු කළ යුතුයි. මේ අනුව ආචාර්ය ශිෂ්‍ය සම්බන්ධතාව මත සමාජ ප්‍රාග්ධනයේ විභව (Potential) පැවැත්ම තීරණය වේ. ආචාර්යවරුන් සාර්ථක නායකයින් ලෙස කටයුතු කරන වීට ශිෂ්‍යයන් ඔවුන්ට ගරු කිරීමට පෙළඹේ. මෙම තත්ත්වය අපහසු හා සංකීර්ණ ගැටලු සහගත තත්ත්වයන් පාලනය කරගැනීමට උපකාර වේ. නමුත් මෑත කාලීනව ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව දුරස් වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. පෙර ශිෂ්‍ය-පරිපාලන ගැටුම් වර්තමානයේ ශිෂ්‍ය-ආචාර්ය ගැටුම් දක්වා පුළුල් වී ඇත. මෑත කාලයෙහි බොහෝ විශ්වවිද්‍යාලවලින් මෙවැනි සිද්ධි වාර්තා වී තිබේ. මෙය විශ්වවිද්‍යාලයවල අනාගත පැවැත්ම සඳහා අහිතකර ආකාරයට  බලපෑමට ඉඩ තිබේ.

<u>අධ්‍යයනයේ අරමුණු :-</u>

මේ අධ්‍යයනයෙන් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වූ ප්‍රධාන අරමුණු තුනකි. එවා නම්x

1. විශ්වවිද්‍යාලය තුළ දැනට තිබෙන ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාවේ ස්වභාවය හඳුනාගැනීම.
2. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පුළුල්වීමට තිබෙන බාධාවන් හා ගැටලු හඳුනා ගැනීම.
3. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාවන් ශක්තිමත් කිරීමට වැදගත් වන උපක්‍රම යෝජනා කිරීම.

<u>පර්යේෂණ ගැටලුව :-</u>

වර්තමානයේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය දෙස බැලීමේ දී පැහැදිලි වන කරුණක් වන්නේ ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව ක්‍රමයෙන් දුරස්වීමේ ස්වභාවයක් පවතින බව යි. මේ සඳහා විවිධ හේතු සාධක බලපා තිබේ. සමස්තයක් ලෙස බලන විට මෑත කාලයෙහි ශිෂ්‍ය ගැටුම්වල වර්ධනයක් පෙන්නුම් කෙරෙයි. ශිෂ්‍ය ගැටුම් බොහෝ විට දක්නට ලැබුණේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් හා විශ්වවිද්‍යාල පරිපාලනය සම්බන්ධවයි. නමුත් මෑතකාලයෙහි ශිෂ්‍යයන්, ආචාර්යවරුන් සමඟ ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය කරගැනීමක් දක්නට ලැබේ. සබරගමුව විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍යයන්ගේ විනය විරෝධී හැසිරීමට  විරෝධය දක්වා ආචාර්යවරුන් විසින් විරෝධතා ව්‍යාපාරයක් දියත් කරනු ලැබීය. මින් පෙනී යන්නේ පෙරට වඩා ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාවේ දුරස් වීමක් පවතින බවයි. මීට අමතරව විශ්වවිද්‍යාලය තුළ සිටින ශිෂ්‍ය කණ්ඩායම්වල විවිධ දේශපාලන මතිමතාන්තර නිසා මතුවන අසහනකාරි පරිසරය ද මේ ආකාරයේ ගැටලුකාරී තත්ත්වයකට හේතු වී තිබේ. (Upul Aberathna, Wasantha, Rathnayaka-2004) රුහුණ විශ්වවිද්‍යාලය තුළ ආචාර්ය-ශිෂ්‍ය ගැටුම් කීපයක් වාර්තා වී තිබේ.  එනම් වෛද්‍ය පීඨයේ මව්කිරිදීමේ පාඨමාලාව සම්බන්ධයෙන් ආචාර්ය-ශිෂ්‍ය ගැටුමක් උසාවිය දක්වා පැතිරයාම ඉන් එකකි. එසේ ම  2005 වර්ෂයේ දී කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ආචාර්යවරුන්ට රාජකාරියට පැමිණීමට බාධාවන ලෙස වැල්ලමඩ සංකීර්ණයේ දී ශිෂ්‍යයන් හැසිරී ඇත. මේ සම්බන්ධව පැමිණිල්ලක් කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ආචාර්යවරුන් උපකුලපතිතුමා වෙත ද ඉදිරිපත් කර ඇත.  (විශ්වවිද්‍යාලයේ නීති නිලධාරීන්ගේ වාර්තාව) මෑත කාලයෙහි අවසන් වසරේ සිසුන් කණ්ඩායමක් කළමනාකරණ හා මූල්‍ය පීඨ පරිපාලනයට නොගැළපෙන ආකාරයට විවිධ තර්ජන එල්ලකර තිබීම මෙන් ම පොදු රැස්වීම්වල දී ශිෂ්‍යයන් විසින් ආචාර්යවරුන් ලෙසවත් නොසලකා නොගැළපෙන  වචනයෙන් ආමන්ත්‍රණය  කරනු ලැබීම වැනි අවස්ථා රාශියක් දක්නට තිබේ. මේ පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ නීති අංශයට ද වාර්තා වී ඇත. විශ්වවිද්‍යාලය පද්ධතිය තුළ අනුගමනය කරනු ලබන ඉගැන්වීම් ක්‍රමවේදයන්, සමාජය තුළ බිහිවී තිබෙන විවිධ වෘත්තීමය අධ්‍යාපන ආයතනවල බලපෑම් ද මෙයට හේතු වී තිබේ. විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය අධ්‍යාපනයට වඩා වෙනත් වෘත්තීය අංශයන්ට වැඩි නැඹුරුවක් දක්වනු පෙනේ. මෙහි ප්‍රතිඵලය වී තිබෙන්නේ ශිෂ්‍යයන් නිල වශයෙන් විශ්ව

විද්‍යාලය තුළ ලියාපදිංචි වී සිටියත් අධ්‍යයන කටයුතු හා අනෙකුත් කටයුතුවලට සහභාගීවන්නේ අඩු වශයෙන් වීමයි. මෙය ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව ශක්තිමත් වීමට අහිතකර ලෙස බලපා තිබේ.

<u>අධ්‍යයන ක්‍රමවේදය :-</u>

මෙම පර්යේෂණය සඳහා සමීක්ෂණ සැලැස්ම (Survey Design) හා සිද්ධි අධ්‍යයන (Case study) ක්‍රමවේදයන් යොදා ගනු ලැබීය. රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා මෙම පීඨය තෝරා ගැනීමට බලපෑ හේතු රාශියකි. ඒ අතර මෙය නව පීඨයක් වශයෙන් රුහුණ විශ්වවිද්‍යාලයට මෑත කාලයෙහි සම්බන්ධ වූවක් වීම විශේෂය. ඊට පෙර දශක දෙකක පමණ කාලයක් මානව හා සමාජීය විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මක විය. පර්යේෂකයා ද මෙම අංශ දෙක යටතේම ආචාර්යවරයකු, පරිපාලන නිලධාරියකු වශයෙන් මෙම පීඨයේ කටයුතු කළ පුද්ගලයකු නිසා අධ්‍යයනය වඩාත් පහසු වේ. වර්තමානය වන විට මෙම පීඨය තුළ ශිෂ්‍යයන් 1300කට වැඩි ප්‍රමාණයක් අධ්‍යයන කටයුතුවල නිරත වන අතර ආචාර්යවරුන් 30 දෙනෙක් ඉගැන්වීම් කටයුතුවල නිරත වී සිටිති. අධ්‍යයනය සඳහා ශිෂ්‍යයන්ගෙන් තෝරා ගත් නියදිය 140කි. එය පීඨයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය ජනගහනයෙන් 10%ක් පමණ වේ. පර්යේෂණය සඳහා තෝරා ගත් ආචාර්යවරුන් ගණන 20කි. එය ප්‍රතිශතයක් වශයෙන් 66% කි. දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන ක්‍රමයන් යොදාගනු ලැබීය.

<u>වගු අංක 01</u> ශිෂ්‍යයන්ගේ නියදිය

| ස්ථලය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | තෝරා ගත් නියදිය |
|---|---|---|
| 1000 පළමු ස්ථලය | 303 | 30 |
| 2000 දෙවන ස්ථලය (පළමු සමාසිකය) | 281 | 28 |
| 2000 දෙවන ස්ථලය (දෙවන සමාසිකය) | 243 | 25 |
| 3000 තෙවන ස්ථලය | 221 | 22 |
| 4000 සිවුවන ස්ථලය | 311 | 35 |
| | 1359 | 140 |

Source: Data Base – Faculty of Management & Finance (2006)

ආචාර්යවරුන්ගේ නියදිය තෝරා ගැනීමේ දී විශේෂ ක්‍රමවේදයක් භාවිතයට නොගත් අතර දැනට ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන ආචාර්යවරුන් අතුරින් 20 දෙනෙක් සම්මුඛ සාකච්ඡාවලට ලක්කරනු ලැබූහ. එමෙන්ම ඔවුන් සඳහා ප්‍රශ්නාවලියක් ද ලබා දෙන ලදී. එහි දී ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ජ්‍යෂ්ඨත්වය සලකනු ලැබීය.

<u>වගු අංක 02</u> ආචාර්යවරුන්ගේ නියදිය

| | මුළු ආචාර්යවරුන් ගණන | තෝරාගත් නියදිය |
|---|---|---|
| පුරුෂ | 16 | 10 |
| ස්ත්‍රී | 15 | 10 |
| | 31 | 20 |

Source: Student Information Brochure – Faculty of Management & Finance (2005/ 2006)

ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් සඳහා ප්‍රශ්නාවලීන් දෙකක් ඉදිරිපත් කර තොරතුරු හා දත්ත එක්රැස් කරන ලදි. මෙම ප්‍රශ්නාවලීන්ට ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්න ඇතුළත් කරනු ලැබීය. මෙයට අමතරව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කිරීමෙන් ද නිරීක්ෂණය කිරීමෙන් ද පරිපාලන නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කරනු ලැබීය. ලබා ගන්නා ලද දත්ත හා තොරතුරු වගු ,ලේඛනවල රූපසටහන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබීය.දත්ත හා තොරතුරු ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් විශ්ලේෂණය කරනු ලැබීය.

<u>දත්ත විශ්ලේෂණය</u>

දැනට විශ්වවිද්‍යාලය තුළ පවතින ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පිළිබඳව ආචාර්යවරුන්ගෙන් මෙන් ම ශිෂ්‍යයන්ගෙන් ද තොරතුරු එක්රැස් කරන ලදි. පොදු වශයෙන් ගත් විට දෙපාර්ශ්වයේ ම අදහස වූයේ ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව දුරස්වෙමින් පවතින බවයි.

<u>වගු අංක 03</u> පවතින සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳ ආචාර්යවරුන්ගේ අදහස

| ස්වභාවය | ප්‍රතිශතය (%) |
|---|---|
| හොඳින් පවතී | 15 |
| දුරස් වෙමින් පවතී | 70 |
| අදහසක් කිව නොහැක | 15 |
| මුළු ගණන | 100 |

මූලාශ්‍රය : නියදි සමීක්ෂණය - 2006 මැයි

නියදියට ඇතුළත් වූ ආචාර්යවරුන්ගෙන් 70%ක අදහස වූයේ ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව දුරස්වෙමින් පවතින බවයි. නමුත් 15%ගේ අදහස වූයේ එය යහපත් මට්ටමක පවතින බවයි. 15%ක් ඒ පිළිබඳව අදහසක් නොමැති බවට ප්‍රකාශ කර ඇත.
මෙය විශ්වවිද්‍යාලය ආචාර්යවරයා , විශ්වවිද්‍යාල පරිසරයෙන් ක්‍රමයෙන් ඉවත්වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන්නක් වේ. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව දුරස් වෙමින් පවතී යන මතය තහවුරු කිරීමට විවිධ කරුණු ඉදිරිපත් කර ඇත.

- ශිෂ්‍ය නායකයන් / ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් නවක සිසුන්ට ලබා දෙනු ලබන වැරදි අවබෝධය.
- ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් අතර විධිමත් සන්නිවේදනයක් දක්නට නොලැබීම.
- ශිෂ්‍ය නියෝජිතයන් පමණක් ආචාර්යවරුන් හා පරිපාලකයින් මුණගැසීමට පැමිණීම.
- ශිෂ්‍යයින් කලහකාරී ලෙස හැසිරීම නිසා ගුරුවරුන් ශිෂ්‍යයින් කෙරෙහි දක්වන ආකල්ප යහපත් නොවීම.
- ශිෂ්‍යයන්ගේ විනය පිළිබඳව ආචාර්යවරුන් සෑහීමට පත්නොවීම.

අධ්‍යයනයේ දී අවධානය දක්වූ කරුණක් වූයේ පවතින ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව කෙසේ හැඩගැසෙන්නේ ද යන්න පිළිබඳවයි. ඒ සම්බන්ධයෙන් විවිධ ස්ථලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් රැස්කළ තොරතුරුවල පවතින රටාව පහත වගුවේ දැක්වේ.

<u>වගු අංක 04</u> ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාවේ වර්තමාන රටාව

| ස්ථලය | හොඳින් පවතී | දුරස් වෙමින් පවතී | අදහසක් කිව නොහැක | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1000 පළමු සමාසිකය | 18% | 65% | 17% | 100% |
| 2000 දෙවන සමාසිකය | 30% | 60% | 10% | 100% |
| 3000 දෙවන සමාසිකය | 30% | 50% | 20% | 100% |
| 4000 දෙවන සමාසිකය | 32% | 50% | 18% | 100% |

මූලාශ්‍රය : නියදි සමීක්ෂණය 2006 මැයි

මෙම ඉහත වගුවට අනුව 1000 ස්ථලයේ අධ්‍යයනය කරනු ලබන ශිෂ්‍යයන්ගෙන් නියදියට ඇතුළත් වූ අයගෙන් 65%ක් ආචාර්ය ශිෂ්‍ය සම්බන්ධතාව දුරස්ව පවතින බව ප්‍රකාශ කර ඇත. මෙම අදහස වගු අංක 2හි ආචාර්ය ශිෂ්‍ය සම්බන්ධතාව පිළිබඳව ආචාර්යවරුන් දැක්වූ (70%) අදහසට ආසන්න අගයක් ගනියි. නමුත් තෙවන හා සිව්වන ස්ථලවල ශිෂ්‍යයින්ගෙන් 50%ක් ඉහත අදහස ප්‍රකාශ කර ඇත. මෙයින් පැහැදිලි වන්නේ ශිෂ්‍යයන් අත්දැකීම් ලබන විට ආචාර්යවරුන් ට ආසන්න වීමේ ප්‍රවණතාවයක් පවතින බවයි. මෙව සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ අදහසක් ප්‍රකාශ කළ නොහැකි 20% ප්‍රමාණයක් සිටින බව අධ්‍යයනයට අනුව හෙළි වී ඇත.

අධ්‍යයන නියදිය සඳහා තෝරාගන්නා ලද ශිෂ්‍ය කණ්ඩායම් විශ්ලේෂණය කිරීමේ දී නිල ශිෂ්‍ය සංගම්වල කටයුතු කරන හා එසේ නිල ශිෂ්‍ය සංගම්වලට සම්බන්ධතාවක් නොදක්වන සිසුන්ගේ අදහස් එක්රැස් කරන ලදි. නියදියට අනුව 10% ප්‍රමාණයක් නිල සංගම්වලට සම්බන්ධ ශිෂ්‍යයන් වූ අතර 90%ක් මෙම නිල සංගම් කටයුතුවල නිලතල දරන පිරිස නොවූහ. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පිළිබඳව අදහස් විශ්ලේෂණය කිරීමේ දී බොහෝ වෙනස්කම් හඳුනාගැනීමට හැකියාවක් ලැබුණි. නිල වශයෙන් ශිෂ්‍ය කණ්ඩායම්වල තනතුරු දරන ශිෂ්‍යයන් පමණක් ආචාර්ය මණ්ඩලය හා සම්බන්ධතා පවත්වාගෙන යාම ප්‍රමාණවත් නොවන බව අනෙක් ශිෂ්‍ය කණ්ඩායමේ 90%කගේ මතය විය. මෙවැනි සම්බන්ධතා පමණක් පැවැතීමෙන් ඇති විය හැකි ප්‍රතිඵල ගැන ඔවුහු අදහස් ඉදිරිපත් කළහ.

- පොදු ශිෂ්‍ය ප්‍රශ්නවලට වඩා පෞද්ගලික අදහස් ඒ තුළින් මතුවීම.
- ශිෂ්‍ය පෞරුෂත්වය වර්ධනයට මෙය බාධාවක් වීම.
- ශිෂ්‍ය ගැටලු සැබෑ ලෙස ම ඉදිරිපත් නොවීම.
- ශිෂ්‍ය සංගම් නියෝජිතයන් බොහෝ විට ඒකාධිපති ස්වභාවයෙන් කටයුතු කිරීම. පොදු ශිෂ්‍ය අවශ්‍යතා සම්බන්ධව මෙය බාධාවක් වීම.
- සියලුම ශිෂ්‍ය ගැටලු ශිෂ්‍ය නියෝජිතයන් මඟින් ඉදිරිපත් කිරීම.
- සෑම ගැටලුවක්ම ශිෂ්‍ය සංගම් හරහා ඉදිරිපත් කළ නොහැකි වීම.
- ශිෂ්‍ය පෞද්ගලිකත්වය ආරක්‍ෂා නොවීම.
- ශිෂ්‍ය සංගම් හරහා ප්‍රශ්න විසඳීමට වැඩිකාලයක් ගත වීම.
- ශිෂ්‍ය සංගම් නියෝජිතයන් පසු වාසි තකා කටයුතු කරීම, ඒ තුළින් දේශපාලන වාසි අත්කරගැනීමට උත්සාහ කිරීම.
- පොදුවේ සිසුන්ට ආචාර්යවරුන් සමඟ කටයුතු කිරීමට තිබෙන අවස්ථා අහිමි වීම.

මේ ආකාරයට ඉදිරිපත් කළ අදහස් විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ ආචාර්ය-ශිෂ්‍ය දුරස්ථභාවය කෙරෙහි ශිෂ්‍යසංගම්වල ක්‍රියාකාරීත්වය ද බලපා තිබෙන බවයි. නමුත් ශිෂ්‍ය නියෝජිතයන් ලෙස කටයුතු කරන අයගේ අදහස මීට වඩා වෙනස් ස්වභාවයක් ගනී. සියලුම ශිෂ්‍යයන්ට ආචාර්යවරුන් මුණගැසීමට අවස්ථාවක් නොමැති නිසා ඒ අය වෙනුවෙන් තමන් එම කාර්යයේ නියුක්ත වන බව ඔවුන්ගේ අදහසයි. මේ තුළින් පොදු ශිෂ්‍ය ප්‍රශ්න, ගැටලු ආදිය පිළිබඳව පොදු එකඟතාවක් ඇති කර ගැනීමට අවස්ථාවක් සැලසෙන බවත්, මෙය ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීමේ උපක්‍රමයක් වශයෙන් වැදගත් බවත් ඔවුන්ගේ අදහසයි.

මේ සම්බන්ධව ආචාර්යවරුන්ගේ අදහස පහත ආකාරයට සම්පිණ්ඩනය කළ හැකිය. ආචාර්යවරුන්ගෙන් 95%කගේ අදහස වන්නේ ශිෂ්‍ය සංගම් නියෝජිතයන් පමණක් ආචාර්යවරුන් මුණගැසීම ප්‍රමාණවත් නොවන බවයි. නමුත් 5%ක් එම සම්බන්ධතාව ප්‍රමාණවත් බව ප්‍රකාශ කර ඇත. මෙම තත්ත්වය විශ්ලේෂණය කරන විට පීඨය තුළ පරිපාලන කටයුතුවලට සම්බන්ධ ආචාර්යවරුන් මෙම 5% තුළ ඇතුළත්ව ඇත. පරිපාලන වශයෙන් ශිෂ්‍ය සංගම් සමඟ කටයුතු කිරීම පහසු හා ලෙහෙසි ක්‍රමයක් ලෙස මේ අය සලකති. නමුත් ඉහත තොරතුරු හා ඉදිරිපත් කර තිබෙන කරුණු අනුව බහුතර ආචාර්යවරුන්ගේ මතය වන්නේ ශිෂ්‍යයන්ගෙන් එක් කොටසකට පමණක් එම අවස්ථාව ලබා දීම සාධාරණ නොවන බවයි . මෙවැනි තත්ත්වයක් නිසා,

- අනෙකුත් පොදු සිසුන්ට සම අයිතිවාසිකම් නොලැබී යාම .
- සමහර ශිෂ්‍ය ගැටලු අතිශයින් ම පෞද්ගලික වීම . (ඒවා සංවේදී ගැටලු වුවත් ඒවා ශිෂ්‍ය සංගම් හරහා ඉදිරිපත් නොවීම නිසා මෙය ශිෂ්‍යයන් අතර අසහනය ඇතිවීමට හේතු වීය හැකිය)
- ශිෂ්‍ය කණ්ඩායම් ඉදිරිපත් කරන සියලුම ගැටලු හා ප්‍රශ්න පොදු ප්‍රශ්න නොවීම.
- පෞද්ගලික අදහස නියෝජනය නොවීම .
- ශිෂ්‍ය නියෝජිතයන් අපක්‍ෂපාතීව කටයුතු නොකිරීම.
- පෞද්ගලික / දේශපාලන අරමුණු සමඟ ශිෂ්‍ය නියෝජිතයන් කටයුතු කිරීම.

ආචාර්යවරුන්ගේ හා ශිෂ්‍යයන්ගේ අදහස් විශ්ලේෂණය කිරීමෙන් පෙනී යන්නේ ශිෂ්‍ය සංගම් ක්‍රියාකාරිත්වය තුළින් බහුතර සිසුන් ආචාර්යවරුන් හා සම්බන්ධතා පැවැත්වීමට තිබෙන අවස්ථාව මඟහරවා තිබෙන බවයි. ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පැවතිය යුතු ස්වභාවය පිළිබඳව ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් යන දෙපාර්ශ්වයම ඉදිරිපත් කර තිබෙන අදහස්වල සමාන කමක් දක්නට ලැබුණි. එනම් ආචාර්ය-ශිෂ්‍ය සම්බනධතාව පන්ති කාමරයේ දී හා බාහිර ක්‍රියාකාරකම්වල දී ද පැවතිය යුතු බවයි. විශ්වවිද්‍යාලය අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පන්ති කාමරයේ දී මෙන් ම ශිෂ්‍ය බාහිර ක්‍රියාකාරකම්වල දී ද අතිශයින් ම වැදගත් බව ආචාර්යවරුන් අවධාරණය කර ඇත. පන්ති කාමරයේ සාමාන්‍ය ප්‍රශ්නවලින් බැහැරව ආචාර්යවරුන් හමුවීමට බාධාවක් තිබේ ද යන ප්‍රශ්නයට 90% පිළිතුරු සපයා තිබුණේ එවැනි බාධාවක් නොමැති බවයි. 10% එවැනි බාධාවක් පවතින බව ප්‍රකාශ කර තිබුණි. ඔවුන් එවැනි බාධාවක් පැවතීමට බලපා තිබෙන හේතු වශයෙන් පහත කරුණු ඉදිරිපත් කර ඇත .

- දේශන නොමැති දිනවල ආචාර්යවරු නොපැමිණීම.
- ආචාර්යවරු කාමරවල නොසිටීම.
- ආචාර්යවරු කාර්ය බහුල වීම.
- විශ්වවිද්‍යාලය තුළ පවතින සම්ප්‍රදායයන් හා පිළිගැනීම් මඟින් බාධා පැමිණීම.
- ශිෂ්‍යයන්ට අවශ්‍ය වේලාවට ආචාර්යවරුන් නොමැති වීම.
- දේශකවරු ලඟ අවශ්‍ය තොරතුරු නොමැති වීම.

දේශන ශාලාවලින් බැහැරව ශිෂ්‍යයන් ආචාර්යවරු මුණගැසීමට අවස්ථාව ලබාගෙන තිබේ ද යන්න පිළිබඳව සමාසික අනුව ලබාදෙන ලද පිළිතුරුවල වෙනස්කම් දක්නට ලැබුණි. මෙම කරුණු අනුව පෙනීයන්නේ ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව පැවැත්වීමට බාධාවක් නොමැති බව බහුතරයේ මතය වුවත් ඒ තුළ යහපත් සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට බාධා වන සාධකයන් ද පවතින බවයි. මෙම සාධකයන් අතර විශ්වවිද්‍යාලය තුළ පවත්නා සම්ප්‍රදායයන් හා පිළිගැනීම් යන කරුණු නියදියට අයත් පිරිසෙන් 60% පමණ වැදගත් සාධකයන් ලෙස ඉදිරිපත් කර තිබුණි. ආචාර්යවරුන් මුණගැසීමේ හැකියාව පිළිබඳව ශිෂ්‍යයන් දැක්වූ අදහස් පහත වගුවේ දැක්වේ.

වගු අංක 05

| | |
|---|---|
| 1000 ස්ථලය | 90% |
| 2000 ස්ථලය | 92% |
| 3000 ස්ථලය | 95% |
| 4000 ස්ථලය | 97% |

මූලාශ්‍රය : නියදි සමීක්ෂණය - 2006 මැයි

මෙයට පිළිතුරු සැපයූ සියලුම ස්ථල ශිෂ්‍යයන්ගෙන් ඉහළ ප්‍රතිචාරයක් ලැබී තිබේ. ශිෂ්‍යයන්* ආචාර්යවරුන් මුණගැසීමේ ඉහළ අගයක් ගෙන තිබේ. එම දත්තවලට අනුව ජ්‍යෙෂ්ඨත්වය වැඩිවන විට ආචාර්යවරු මුණගැසීමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මෙයට හේතු වන්නේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය තුළ අත්දැකීම් වැඩිවන විට මෙහි තිබෙන සම්ප්‍රදායයන්, මතයන් , පිළිබඳ එතරම් සැලකිල්ලක් නොදක්වා කුඩා කණ්ඩායම් වශයෙන් හෝ තනි පුද්ගලයන් වශයෙන් ආචාර්යවරුන් මුණගැසීම් සිදුවන බවයි. සමීක්ෂණයෙන් ලැබුණු දත්ත විශ්ලේෂණය කිරීමේ දී ශිෂ්‍යයින් ආචාර්යවරුන් මුණගැසුණු හේතු පහත ලෙස ගොනුකළ හැකිය.

- පැවරුම් උපදෙස් ලබා ගැනීම
- පැවරුම් ලකුණු ලබාගැනීම
- විෂය කරුණු නිරාකරණය කර ගැනීම
- විශේෂවේදී පාඨමාලාවන් තෝරා ගැනීම
- අමතර දේශන කාල වෙනස් කර ගැනීම
- සුහදතාව සඳහා

මෙම හේතු විශ්ලේෂණයෙන් පැහැදිලි වන මුඛ්‍ය කාරණය වනුයේ අධ්‍යයන කටයුතු මුල් කරගෙන ආචාර්යවරුන් මුණගැසී ඇති බවයි. ශිෂ්‍යයන් ආචාර්යවරුන් මුණගැසීමට පැමිණීමේ දී වෙනස්කම් හඳුනාගත හැකි විය. එනම් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් තනි පුද්ගලයන් වශයෙන් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් පැමිණීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම ය.

වගු අංක 06 ආචාර්යවරුන් මුණගැසීමේ රටාව

| ස්ථලය | පුද්ගලික මට්ටම | කණ්ඩායම් වශයෙන් | වෙනසක් නොවේ |
|---|---|---|---|
| 1000 | 14% | 79% | 7% |
| 2000 | 15% | 70% | 15% |
| 3000 | 30% | 70% | - |
| 4000 | 60% | 30% | 10% |

මූලාශ්‍රය - නියදි සමීක්ෂණය - 2006 මැයි

ඉහත වගුව අනුව පැහැදිලි වන්නේ 1000 ස්ථලයේ ශිෂ්‍යයන් 14%ක් ද 4000 ස්ථලයේ ශිෂ්‍යයන් 60%ක් ද පුද්ගලික මට්ටමෙන් ආචාර්යවරුන් මුණගැසී තිබීමයි. මින් පැහැදිලි වන්නේ අත්දැකීම් පුළුල්වීමත් , ජ්‍යෙෂ්ඨත්වය වැඩිවීමත් සමඟ ඔවුන්ගේ අවශ්‍යතාවන් සාමූහික අවශ්‍යතාවන්ට වඩා පුද්ගලික මට්ටමක පවතින බවයි.

ආචාර්ය- ශිෂ්‍ය සම්බන්ධතාව පිළිබඳව තෝරාගන්නා ලද ශිෂ්‍ය නායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්විණි. එහි දී ඔවුහු විශ්වවිද්‍යාලය තුළ මෙවැනි තත්වයක් ඇතිවීමට බලපා තිබෙන හේතු රාශියක් ඉදිරිපත් කළහ. මූලික වශයෙන් ඔවුන්ගේ අදහස වූයේ මෙය විශ්වවිද්‍යාලය තුළ පමණක් දක්නට ලැබෙන ලක්ෂණයක් නොව, නිවෙස් හා පාසැල් තුළ, ආගමික මධ්‍යස්ථාන තුළ සහ වෙනත් ආයතන තුළ ද දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් බවයි. විශ්වවිද්‍යාලයට ඇතුළත්වන ශිෂ්‍යයන් තුළ ද මෙම අත්දැකීම් දක්නට ලැබේ. රට තුළ පවතින තරඟකාරී විභාග ක්‍රමය නිසා ඔවුහු පෞද්ගලික පන්තිවලට සහභාගී වෙති. මෙම ආයතන තුළ ඔවුනට අනවශ්‍ය නිදහසක් ලැබෙන නිසා විනය පිරිහීමක් දක්නට ලැබේ. ශිෂ්‍යයින් වැඩිකාලයක් මෙම පරිසරය තුළ කටයුතු කරන අතර ඒවායේ අධ්‍යාපන කටයුතුවල යෙදෙන ආචාර්යවරුන් සමඟ ශිෂ්‍යයින් වඩාත් සම්බන්ධව කටයුතු කරනු ඇත. එසේ ගොඩනැඟෙන සම්බන්ධය එම පුද්ගලයින්ගේ මුදල් ඉපයීමේ අරමුණට අදාළ වේ. මෙම පරිසරයෙන් විශ්වවිද්‍යාලයට පැමිණෙන ශිෂ්‍යයා තමාගේ අත්දැකීම් අනුව එවැනි ආචාර්යවරුන් පිරිසක් විශ්වවිද්‍යාලය තුළින් ද බලාපොරොත්තු වේ. නමුත් විශ්වවිද්‍යාලය තුළ ආචාර්යවරුන්ගේ චර්යාවන් වෙනත් ස්වභාවයක් ගන්නා නිසා ඔවුන් අතර සම්බන්ධතාව ගොඩනගා ගැනීම අපහසු වේ.

## නිගමන හා යෝජනා

ඉහත සඳහන් විශ්ලේෂණය අනුව එළඹි නිගමන හා පවතින අයහපත් තත්ත්වය වෙනස් කිරීම සඳහා අනුගමනය කළ හැකි යෝජනා මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කෙරේ. කෙටිකාලීන වශයෙන් ආචාර්යවරුන් තමාගේ කාලසටහන තුළ ශිෂ්‍යයන් මුණගැසීම සඳහා කාලපරිච්ඡේදයන් කීපයක් වෙන් කිරීම වැදගත් වේ. මෙසේ වෙන්කර තිබෙන බව ශිෂ්‍යයන් වෙත ඵලදායීව සන්නිවේදනය කළ යුතුය. මෙම වෙන්කරන කාලපරිච්ඡේද ශිෂ්‍යයන්ට දේශන නොමැති කාලපරිච්ඡේද වීම වඩාත් වැදගත් වේ. සෑම ශිෂ්‍ය කණ්ඩායමකගේ ම අදහස වූයේ ශිෂ්‍යයන්ට අවශ්‍ය වේලාවල දී ආචාර්යවරුන් මුණගැසීමට බාධාවක් තිබෙන බවයි. මේ අනුව වඩාත් සැලසුම් සහගත ලෙස මෙය සකස් කිරීමෙන් ශිෂ්‍යයන්ට ආචාර්යවරුන් මුණගැසීමට තිබෙන ඉඩකඩ පුළුල් කළ හැකිය. මෙය අධ්‍යයන අංශ මට්ටමින් වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම තුළින් ආචාර්යවරුන් අධ්‍යයනාංශය තුළ වැඩි වශයෙන් රඳවාගැනීමට උපකාරී වේ.

ශිෂ්‍යයන් සංවිධානය කරනු ලබන පොදුකටයුතුවලට ආචාර්ය මණ්ඩලය සක්‍රීයව දායක විය යුතුය. එසේම මෙම කටයුතු සංවිධානය කිරීමේ දී හා ඒවා ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය උපදෙස්, මඟපෙන්වීම් ලබා දීම තුළින් වඩාත් ඵලදායීව එකී කටයුතු කිරීමට අවස්ථාව ලැබේ. මේ තුළින් ආචාර්යවරුන් පිළිබඳව ශිෂ්‍යයන් තුළ යහපත් ආකල්ප වර්ධනය වීම ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව වැඩි දියුණු කිරීමට උපකාරී විය හැකිය.

දිගුකාලීන වශයෙන් ආචාර්යවරුන් තමාගේ ප්‍රධාන භූමිකාවක් වන ඉගැන්වීම, පර්යේෂණය කිරීම යන කාර්ය පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. ආචාර්යවරයා ශිෂ්‍යයන්ට නායකත්වය සපයන්නෙක්, මඟපෙන්වන්නෙක් විය යුතුයි. එහි දී ශිෂ්‍යයෝ ආචාර්යවරුන් කෙරෙහි බැඳීමත් ගරු කිරීමත් ඇති කර ගනිති. ජාතික මට්ටමින් සලකා බලන විට විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්ගෙන් 20% ප්‍රමාණයක් පර්යේෂණ කටයුතුවල නියුක්ත වන අතර ඔවුන්ගේ කාලයෙන් 40%කටත් අඩු ප්‍රමාණයක් පර්යේෂණ කටයුතු සඳහා යොදාගෙන තිබේ. මින් පැහැදිලි වන්නේ ශිෂ්‍යයන්ට අවශ්‍ය නව දැනුම ගවේෂණය, හා බෙදා දීම් පිළිබඳව විශ්වවිද්‍යාලය තුළ යම් ආකාරයක ගැටලු සහගත තත්ත්වයක් පවතින බවයි. මෙම පර්යේෂණයට පිළිතුරු සැපයූ ශිෂ්‍යයන්, ආචාර්යවරුන් වෙත නොපැමිණීම හේතු වශයෙන් දක්වා ඇති වැදගත් කරුණක් වන්නේ තමාට අවශ්‍ය තොරතුරු ඔවුන් සතුව නොමැති වීමයි. ආචාර්යවරයා ලබා දෙන දැනුම කාලීනව වැදගත් කමක් තිබෙන බව ශිෂ්‍යයන්ට අවබෝධ විය යුතුය. ඉගැන්වීම් හා ඉගැන්වීම් රටාවන් පිළිබඳව අවධානය යොමුකළ යුතුය. ආචාර්යවරුන්ගේ මෙම චර්යාත්මක වෙනස්කම් ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදුකර ඇත.

ආචාර්ය-ශිෂ්‍ය සම්බන්ධතාව තහවුරු කිරීම සඳහා ශිෂ්‍ය සංවිධානවල කාර්යභාරය වඩාත් පුළුල් කළ යුතුව ඇත. ඔවුන්ගේ නායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ශිෂ්‍ය සංගම් බොහෝ විට ක්‍රියාත්මක වන්නේ ඔවුන්ගේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිවයි. නමුත් ආචාර්යවරුන් සක්‍රිය මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, ඔවුන්ගේ අවශ්‍යතාවන් හඳුනා ගතයුතුය. ශිෂ්‍ය සංගම් වැඩසටහන් සකස් කිරීමේ දී අවශ්‍ය උපදෙස් ලබාගැනීමට උනන්දු නොවන අතර ඔවුන් සකස් කළ වැඩසටහන්වලට සහභාගී වීමට ආරාධනා කිරීම නිසා බොහෝ විට ආචාර්යවරුන්ගේ සහභාගීත්වයේ අඩුවක් දක්නට ලැබේ. එම නිසා මෙම වැඩසටහන්වලට ආචාර්යවරුන්ගේ මැදිහත් වීමක් තිබෙන්නේ නම් ඒ තුළින් ශිෂ්‍ය නායකයන් තුළ යහපත් ආකල්පයක් වර්ධනය වීමට පුළුවන. එය අනෙක් ශිෂ්‍ය කණ්ඩායම් වෙත බලපෑම තුළින් යහපත් පරිසරයක් නිර්මාණය වේ. ශිෂ්‍ය සහභාගීත්වය වැඩි කිරීම තුළින් මෙයට වැඩි බලපෑමක් කළහැකි වේ. ශිෂ්‍ය සංගම්වලින් පමණක් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සියලුම ප්‍රශ්න ආචාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් නොවේ. ආචාර්යවරුන් එයට මැදිහත් නොවීමට ඉඩ තිබේ. වෙනස් ආකාරයේ වැඩසටහන් තුළින් , එනම් පර්යේෂණ කටයුතු සඳහා ඔවුන් සහභාගී කරවා ගැනීම, ඔවුන්ගේ රැකියා අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම, ඒ සඳහා අවස්ථාවන් සලසා දීම ඔවුන්ගේ පුද්ගලික ප්‍රශ්න විසඳීම සඳහා දුක්ගැනවිලි කමිටු පිහිටුවීම හා ඒවාට ශිෂ්‍ය සහභාගීත්වය ලබාගැනීම වැදගත් වේ. පොදු ශිෂ්‍ය සහභාගීවීම ද වැඩි කළ යුතුය. විශ්වවිද්‍යාලය තුළට ශිෂ්‍යයන් අලුතින් ඇතුළත් කිරීමේ දී ඔවුන් තුළ යහපත් ආකල්ප ගොඩනැගෙන ආකාරයේ සක්‍රීය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුයි. ක්‍රියාත්මක වන බොහෝ වැඩසටහන් ඔවුන්ගේ දේශපාලන න්‍යායපත්‍රයට අනුව සකස් කළ වැඩසටහන් වේ. එතුළින් දේශපාලන වශයෙන් බලය ලබා ගැනීම අරමුණු කර තිබේ. මේ නිසා විශ්වවිද්‍යාල පරිපාලනය විසින් නවක සිසුන්ගේ පෞරුෂ සංවර්ධන වැඩසටහන් සකස් කළ යුතුව ඇත. එහි දී විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි වැදගත්කම අවධාරණය කළ යුතුය. ආචාර්යවරුන්ගේ වෘත්තිය සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ යුතුයි. එහි දී ආචාර්යවරුන් ආර්ථිකයේ පවත්නා ආයතන සමඟ කිට්ටු සම්බන්ධතාවක් ගොඩනඟාගැනීමට කටයුතු කළ යුතුය.

## National Digitization Project

### *National Science Foundation*

Institute : University of Ruhuna

1. Place of Scanning : University of Ruhuna, Wellamadama, Matara
2. Date Scanned : 2017.12.19
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : Chamika Kanishka

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Senior Assistant Librarian

Name : Kusala Fernando

Signature : ..........

Date : 2017.12.19

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*